පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය: 08

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය : **කතෝලික ධර්මය**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : **පැය 02 යි.**

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශුභාරංචි කතුවරුන් අතර එකම අන්‍ය ජාතික ශුභාරංචි කතුවරයා වන්නේ,
    (1) ශුද්ධ වූ මතෙව් තුමා ය. (2) ශුද්ධ වූ ලූක් තුමා ය.
    (3) ශුද්ධ වූ ජොහාන් තුමා ය. (4) ශුද්ධ වූ මාක් තුමා ය.

02. ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ශුභාරංචි කතුවරු දෙදෙනා වන්නේ,
    (1) ශුද්ධ වූ ලූක් තුමා හා මාක් තුමා ය. (2) ශුද්ධ වූ ලූක් තුමා හා මතෙව් තුමා ය.
    (3) ශුද්ධ වූ ලූක් තුමා හා ජොහාන් තුමා ය. (4) ශුද්ධ වූ ජොහාන් තුමා හා මාක් තුමා ය.

03. අධෛර්යය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වා දෙන උපමා කතාව වන්නේ,
    (1) වපුරන්නා පිළිබඳ උපමාව යි. (2) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව යි.
    (3) නැති වූ බැටළුවා පිළිබඳ උපමාව යි. (4) වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව යි.

04. ජේසුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
    (1) ගලීලයෙනි. (2) ජෙරුසලමෙනි.
    (3) ජුදයාවෙනි. (4) සමාරියෙනි.

05. දාවිත් රජතුමාගෙන් ලෝක ගැලවුම්කරුවාණන් පැමිණෙන බව දාවිත් රජතුමාට දන්වනු ලැබුවේ,
    (1) යෙසායා දිවැසිවරයා ය. (2) නාතාන් දිවැසිවරයා ය.
    (3) මීකා දිවැසිවරයා ය. (4) ජෙරමියා දිවැසිවරයා ය.

06. 'එම්මානුවෙල්' යන නාමෙහි අර්ථය වන්නේ,
    (1) දෙවියන් වහන්සේ අප සමග ය. (2) දෙවියන් වහන්සේගේ මිත්‍රයා ය.
    (3) ජේසුස් වහන්සේ අප සමග ය. (4) දෙවියන් වහන්සේ යවනු ලබන සේක.

07. ජේසුස් වහන්සේගේ උත්පත්ති සමය තුළ සියලු වැසියන්ගේ සංගනනයක් ගැනීමට නියෝග කරන්නේ.
    (1) උත්තම පූජකයා විසිනි. (2) අගොස්තුස් අධිරාජ්‍යයා විසිනි.
    (3) ආණ්ඩුකාරවරයා විසිනි. (4) පිලාත් විසිනි.

08. ස්නාවක ජොහාන් තුමා උපත ලබා ...... දිනයේ දී චර්මඡේදන පිළිවෙත සිදු කෙරුණි.
    (1) හය වන (2) තුන් වන
    (3) අට වන (4) හත් වන

09. ''මා මෙය දැනගන්නේ කෙසේ ද? මම මහල්ලෙක් මි. මාගේ භාර්යාව ද වයස්ගතව සිටී'' මෙලෙසින් දේව පළිවිඩය අවිශ්වාස කළේ,
    (1) සෙකරියස්තුමා ය. (2) ආබ්‍රහම්තුමා ය. (3) ජාකොබ්තුමා ය. (4) ස්නාවක ජොහාන් තුමා ය.

10. නාසරෙත් ධර්මශාලාවේ දී ජේසුස් වහන්සේ දේව වචනය කියවීමට යොදා ගනු ලැබුවේ කාගේ ග්‍රන්ථය ද?
   (1) දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය යි. (2) දිවැසිවර ජෙරමියාගේ ග්‍රන්ථය යි.
   (3) දිවැසිවර ආමොස්ගේ ග්‍රන්ථය යි. (4) දිවැසිවර හොසියාගේ ග්‍රන්ථය යි.

11. 'ශුද්ධාත්මයාණන් වහන්සේ' යන යෙදුම වෙනුවට පුරාණ ගිවිසුමේ භාවිතා කළ හැකි යෙදුමක් **නොවන්නේ**,
   (1) ආත්මානුභාවය (2) දේවාත්මානුභාවය (3) ශුද්ධාත්මය (4) ස්ප්‍රිතු සාන්තු වහන්සේ

12. අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබන්නේ,
   (1) පූජා ප්‍රසාදිතුමා ය. (2) තේවාචාර්යතුමා ය. (3) රාජගුරු ප්‍රසාදිතුමා ය. (4) දහම් ගුරුවරයා ය.

13. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානය වන්නේ,
   (1) ප්‍රසාද ස්නාපනය ය. (2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.
   (3) අභිවෘර්ධි ආලේපය ය. (4) රෝගීන්ගේ ආලේපනය ය.

14. පුරාණ ගිවිසුමේ ප්‍රථම වරට පූප සහ මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ,
   (1) ආබ්‍රහම් තුමා ය. (2) සෙකරියස් තුමා ය.
   (3) ජාකොබ් තුමා ය. (4) මෙල්කිසදෙක් තුමා ය.

15. නුසුදුසු ලෙස රොටී වළඳන හා මිදියුෂ පානය කිරීමෙන් ජේසුස් වහන්සේගේ ශරීරයට හා රුධිරයට විරුද්ධව පව් කරන බව පවසන ලිපිය කුමක්ද?
   (1) 2 කොරින්ති ය. (2) 1 කොරින්ති ය.
   (3) ගලාති ය. (4) 1 කොලොස්සි ය.

16. අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ බාහිර සලකුණ කුමක්ද?
   (1) අපේක්ෂකයාගේ නළල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම යි.
   (2) ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කිරීම යි.
   (3) අපේක්ෂකයින් මත දෑත් විහිදා ශුද්ධාත්ම වරම් පතා යැදීම යි.
   (4) අභිවෘද්ධි ආලේපය දානය කිරීම සඳහා අපෙක්ෂකයින් කැඳවීම යි.

17. සබත් දින වැදගත්කම අපට පෙන්වා දෙන පනත වන්නේ,
   (1) දෙවන දේව පනත යි. (2) පළමු දේව පනත යි.
   (3) හතරවන දේව පනත යි. (4) තුන්වන දේව පනත යි.

18. අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ හිස වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේත් එහි අවයව වන ශුද්ධ වූ සභාවත් දෙවියන් වහන්සේට කරන ප්‍රසිද්ධ පූර්ණ වන්දනාව ජනවන්දනාව වේ.' මෙසේ ජනවන්දනාව අර්ථ කථනය කරන්නේ,
   (1) 'වෙහෙසෙන මිනිස්සු ' යන විශ්ව ලේඛනය යි.
   (2) 'දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ' යන විශ්ව ලේඛනය යි.
   (3) දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ජන වන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව යි.
   (4) කතෝලික සභා ධර්මෝපදේශය යි.

19. ශුද්ධ වූ සභාවේ නිළ යැදුම වන්නේ,
   (1) ස්වාමිවාක් ආරාධනාව යි. (2) ජපමාලය යි.
   (3) පාදනමස්කාරය යි. (4) යාම යැදුම යි.

20. දිව්‍ය පූජාවේ දේව වාක්‍ය පිළිවෙතට අයත් කොටසක් වන්නේ,
   (1) පඬුරු මත යැදුම (2) විශ්වාස ලක්ෂණය (3) ස්වාමිවාක් ආරාධනාව (4) ස්තෝත්‍ර යාගික යැදුම

(ලකුණු 2X20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ලූක් ශුභාරංචිය හඳුන්වන තවත් නම් **හතරක්** ලියන්න.
    (ii) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය වර්ග **හතර** නම් කරන්න.
    (iii) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු **හතරක්** නම් කරන්න.
    (iv) ශුද්ධාත්ම ඵල **හතරක්** ලියන්න.
    (v) දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙතට අයත් කොටස් **හතරක්** නම් කරන්න.

(ලකුණු 4X5=20)

02. (i) ලූක් ශුභාරංචියේ සඳහන් කාන්තාවන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02)
    (ii) ලූක් ශුභාරංචියේ සඳහන් ප්‍රශංසා ගීත **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
    (iii) ශුද්ධ වූ ලූක් තුමා තම හැකියා දක්ෂතා තුළින් ශුභාරංචිය ප්‍රකාශ කළා සේ, ඔබේ හැකියා දක්ෂතා තුළින් ඔබ අන් අයට ශුභාරංචිය ප්‍රකාශ කරන අයුරු කරුණු **පහකින්** ලියන්න. (ලකුණු 05)

03. (i) දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳව ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
    (ii) ස්නාවක ජොහාන් තුමාගේ අනුශාසනා ලැබූ කණ්ඩායම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
    (iii) ස්නාවක ජොහාන් තුමාගේ අනුශාසනාවන්ගෙන් ඔබේ ජීවිතයට ලැබෙන මගපෙන්වීම් **පහක්** ලියන්න.(ලකුණු 05)

04. (i) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට ඔබ සූදානම් විය යතු ආකාර **දෙක** නම් කරන්න. (ලකුණු 02)
    (ii) දිව්‍ය පූජාවෙන් පරිබාහිර ව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අවසර හිමිවන සාධාරණ හේතු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
    (iii) දිව්‍ය සත්ප්‍රසාද මාර්ගයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේව ලබා ගත් ඔබ කරන යහපත් ක්‍රියා **පහක්** ලියන්න. (ලකුණු 05)

05. (i) කතෝලික විශ්වාසයට අනුව මිත්‍යා ඇදහිලි **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
    (ii) කිතුනු අපට ඉරුදින වැදගත් වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03)
    (iii) ඉරුදින ශුද්ධවත් ව ගත කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) ''ලිටුර්ජියා'' යන්න සෑදී ඇති ග්‍රීක වචන **දෙක** ලියන්න. (ලකුණු 02)
    (ii) ජනවන්දනාවේ ප්‍රධාන අංග **තුන** නම් කරන්න. (ලකුණු 03)
    (iii) දිව්‍ය පූජා මෙහෙයට අර්ථාන්විතව සහභාගි වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 5X2=10)
    (i) දේව ප්‍රසාද නිධාන
    (ii) ශුද්ධවන්තයින්
    (iii) ජේසුස් වහන්සේගේ දූත සේවාව
    (iv) සකේවුස් පිළිබඳ සිද්ධිය

***

**අවසාන වාර පරීක්ෂණය - 2022**
**කතෝලික ධර්මය -පිළිතුරු පත්‍රය**
**08 ශ්‍රේණිය**

## I කොටස

01. (2) ශුද්ධ වූ ලූක් තුමා ය.
02. (2) ශුද්ධ වූ ලූක් තුමා හා මතෙව් තුමා ය.
03. (4) වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව යි.
04. (1) ගලීලයෙනි.
05. (2) නාතාන් දිවැසිවරයා ය.
06. (1) දෙවියන් වහන්සේ අප සමග ය.
07. (2) අගොස්තුස් අධිරාජ්‍යයා විසිනි.
08. (3) අට වන
09. (1) සෙකරියස්තුමා ය.
10. (1) දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය යි.
11. (4) ස්ප්‍රීතු සාන්තු වහන්සේ
12. (3) රාජගුරු ප්‍රසාදිතුමා ය.
13. (2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.
14. (4) මෙල්කිසදෙක් තුමා ය.
15. (2) 1 කොරින්ති ය.
16. (1) අපේක්ෂකයාගේ නළල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම යි.
17. (4) තුන්වන දේව පනත යි.
18. (2) 'දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ' යන විශ්ව ලේඛනය යි.
19. (4) යාම යැදුම යි.
20. (2) විශ්වාස ලක්ෂණය (ලකුණු 2X20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) යාච්ඤාවේ ශුභාරංචිය/ දයාවේ ශුභාරංචිය/ අන්‍ය ජාතිකයින්ගේ ශුභාරංචිය/ශුද්ධාත්මයාණන්ගේ/ කොන්වූවන්ගේ/ දිළින්දන්ගේ ශුභාරංචිය

 (ii) ස්වභාවධර්මය හා සම්බන්ධ/රෝගීන් සුව කිරීම/ දුෂ්ටාත්ම දුරු කිරීම/ මළවුන් උත්ථාන කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්ය

 (iii) මෙල්කිසදෙක්ගේ යාගය/ මන්නා භෝජනය/ ඉශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය/ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය

 (iv) ස්නේහය/ප්‍රීතිය/සමාදානය/ඉවසීම/කරුණාව/යහපත්කම/නොබිදෙන දිරිය/සාන්තදාන්තකම/විශ්වාසවන්තකම/ මර්යදාව/ ව්‍රතභාවය/ පිරිසිදුකම

 (v) ඇතුළුවීමේ ගීය හා පෙරහැර/ ආචාරය/ හැඳින්වීම/ පශ්චත්තාපික යැදුම/ ස්වාමිනී කරුණා කළ මැනව/ සුරදූත ගීය/ පොදු යැදුම (ලකුණු 4X5=20)

02. (i) මරිය තුමිය/එළිසබෙත් තුමිය/ අන්නා දිවැසිවරිය/ නායින් නුවර වැන්දඹුව/ පව්කාර ස්ත්‍රිය/ මාර්තා හා මරියා/ කුදු ස්ත්‍රිය (ලකුණු 02)

 (ii) මරියාවන්ගේ උදාන ගීය/ සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීය/ දේව දූතයන්ගේ පැසසුම් ගීය/ විමුක්තිදායකයාණන් හඳුනාගත් සිමියොන් තුමාගේ ගීය (ලකුණු 03)

 (iii) ලේඛන හැකියාව තුළින් පාසලේ බිත්ති පුවත්පතකට නිර්මාණ එකතු කිරීම / කථන හැකියාව තුළින් උදෑසන රැස්වීමේ දී කථාවක් කිරීම/ ගායන හැකියාව තුළින් පාසලේ ශිෂ්‍ය සමිතිවල ගායනා කිරීම/ රංගන හැකියාව තුළින් බයිබල් නාට්‍ය රඟපෑම, නිර්මාණය කිරීම ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දේනන. (ලකුණු 05)

03. (i) වපුරන්නා පිළිබඳ උපමාව/ නිධානය, මුතු ඇටය, දැල පිළිබඳ උපමා (ලකුණු 02)

(ii) ජනතාව/ අයකැමියන්/ හමුදා නිලධාරීන් (ලකුණු 03)

(iii) අත්‍යාවශ්‍ය දේ පවා අන් අය සමග බෙදා ගැනීම/ මිනිසාගේ මූලික අවශ්‍යතා සඳහා සංවේදී වීම/ තම වාසිය වෙනුවෙන් අන් අය තලා පෙලා නොදැමීම/ ශිෂ්‍යයෙකු ලෙස වගකීම් නිසි ලෙස ඉටු කිරීම ආදී ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) අභ්‍යන්තර සූදානම/ බාහිර සූදානම (ලකුණු 02)

(ii) රෝගී වීම/ වයස්ගත වීම/ දිව්‍ය පූජාව පැවැත්වීමට පියතුමෙකු නොමැති වීම (ලකුණු 03)

(iii) යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම/ අන් අයට උදව් කිරීම/ සියලු දෙනා සමග සමගියෙන් සිටීම ආදී ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. (i) නැකත් බැලීම/ බලි තොවිල්/ ලග්න එලාපල/ යන්ත්‍ර මන්ත්‍ර/ සාස්තර බැලීම/ගුරුකම්/ ජේන බැලීම / හූනියම්/ දෙහි කැපීම (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ උත්ථාන වූ දිනය /උත්ථාන වූ ජේසුස් වහන්සේ වැඩිපුර ම දර්ශනය වූ දිනය/ ශුද්ධාත්මාගමනය සිදු වූ පෙන්තකොස්ත දිනය (ලකුණු 03)

(iii) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීම/ දහම් පාසලට සහභාගි වීම/ ආගමික පත පොත කියවීම/ වැඩිපුර යාච්ඤා කිරීම/ අන් අයට උදව් කිරීම/ ශ්‍රමදානවලට සහභාගි වීම/ රෝගීන්ට උපස්ථාන කිරීම ආදී ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) ලාඔස්/ එර්ගොන් (ලකුණු 02)

(ii) දිව්‍ය පූජාව/ දේව ප්‍රසාද නිධාන/ යාම යැදුම (ලකුණු 03)

(iii) දිව්‍ය පූජාවේ ආරම්භයට පෙර පැමිණීම/ දේව වාක්‍යයට සවන් දීම/ දිව්‍ය පූජාව තුළ යාච්ඤාවන්ට හා ගායනාවන්ට සහභාගි වීම/ පඬුරු පෙරහැරට සම්බන්ධ වීම/ හඬ නගා පිළිතුරු දීම/ දිව්‍ය පූජාව අවසානය තෙක් භක්තියෙන් සහභාගි වීම ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07. ප්‍රධාන කරුණු පහක් ඇතුළත් වන සේ පිළිතුර ලියා තිබිය යුතුය.

(i) 23 පාඩම (පෙළ පොත 89 පිටුව)

(ii) 19 පාඩම

(iii) 09 පාඩම

(iv) 03 පාඩම (පෙළ පොත 10 පිටුව) (ලකුණු 5X2=10)

***


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න